**කුලියාපිටිය නගර සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 14 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 14 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.16,099,294ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ස්ථිර තැන්පතු අළුත් කිරීමේ නිවේදන ලබාදෙන ලෙස බැංකුව වෙත දන්වා ඇති අතර ස්ථාවර වත්කම් උපලේඛන අවසන් ගිණුම සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 1.4 අනුකූල නොවීම්

## 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 | සභාව සතු වාහන 04ක ඉන්ධන දහනය පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වාහන 04 අළුත්වැඩියාව සඳහා යොමුකර ඇති බැවින් එම අළුත්වැඩියාව නිමවීමෙන් පසු ඉන්ධන දහනය පරීක්ෂාව සිදු කරන ලෙස යාන්ත්‍රික ඉංජිනේරු මහතා වෙත ලිඛිතව දන්වා ඇත. |

## 02. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.44,989,005 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.56,421,164 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

## 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2019වර්ෂය ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 වර්ෂය ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| I. | වරිපනම් හා බදු | 15,271 | 13,948 | 13,112 | 12,757 | 15,184 | 16,127 | 13,905 | 12,408 |
| II. | බදු කුලී | 17,099 | 20,095 | 19,297 | 1,203 | 16,458 | 16,179 | 16,215 | 405 |
| III. | බලපත්‍ර ගාස්තු | 17,383 | 15,464 | 15,467 | - | 17,525 | 15,118 | 15,115 | 3 |
| IV. | වෙනත් ආදායම් | 132,196 | 114,595 | 111,110 | 36,359 | 118,697 | 13,243 | 38,489 | 37,925 |
| | එකතුව | 181,949 | 164,102 | 158,986 | 50,319 | 167,864 | 60,667 | 83,724 | 50,741 |

**2.2.2 වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟය රු.12,723,248 ක් වූ අතර එයින් රු.6,402,773 ක් වසරකට වඩා වැඩි කාලයකට අදාල විය. | පනතේ විධිවිධාන අනුව හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නගර සභා ආඥා පනතේ 170 වගන්තිය අනුව වරිපනම් දේපල 116 ක් සඳහා දේපල තහනම් කිරීම් සිදුකළ අතර ඒ අනුව රු.1,754,421ක් අයකර ගැනීම සඳහා කටයුතු කරන ලදී. |
| (ආ) | වරිපනම් දේපල 13 කට අදාළව රු.2,798,353 කට වැඩි වරිපනම් බදු හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාළ හිඟ ශේෂ දන්වා ලිපි යවා හිඟය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

### 2.2.3 කුලී

------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| සභාව සතු වත්කම් 07 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,057,789 ක කුලී මුදලක් අයවීමට පැවතුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.27,672,720ක් විය. එම හිඟයෙන් 2020 වර්ෂය තුළ රු.16,984,667 ක් අයකරගෙන තිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්ය සාධනය

-----------------

නගර සභා ආඥා පනතේ 04 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතාසේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණ කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| නගර සභා ආඥා පනතේ 157 වන වගන්ති යටතේ ප්‍රධාන කාරණා 15ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 05ක් වෙනුවෙන් පමණක් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සභාවේ අවශ්‍යතාවය මත අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී සභාවට අදාළ අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට කටයුතු කරමි. |

**(ආ) තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්ව හඳුනාගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු 08ක් වෙනුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.10,374,669ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු අනුව ඵලදායී ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

**3.2 කළමණාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- | --- |
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.70,336,952ක් වූ අතර මෙම ලැබිය යුතු ශේෂයන්ගෙන් රු.29,387,595ක වටිනාකමක් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට අය නොවීපැවතුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතින අතර උසාවි දඩ මේ වන විට ලැබී අවසන් බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.57,163,986 ක් විය. | ගෙවියයුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකමින් රු.9,622,124ක් ගිවිසුම්ගත කාලය අවසන් වූ පසු ආපසු ගෙවිය යුතු වටිනාකම් බව දන්වා සිටිමි. |

**3.3 මානව සම්පත් කළමණාකරණය**

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තෘතීයික මට්ටමේ තනතුරු 02 ක්ද, ද්වීතීයික මට්ටමේ තනතුරු 10 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 25 ක්ද වශයෙන් 37 ක පුරප්පාඩු පැවතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සපුරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ද්විතීයික හා තෘතියික තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම සඳහා අනුමැතිය ලබාගැනීමට අදාළ අයදුම්පත්‍ර යොමු කර ඇත.<br>ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු තනතුරු 25 සඳහා 2019.08.09 දින ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර අදාළ සම්මුඛ පරීක්ෂණයන් සිදු කර අදාළ නිර්දේශ ලබාගෙන අනුමැතිය සඳහා යොමු කර ඇත. |
| (ආ) | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවාගෙන තිබූ සංඛ්‍යාව 13 ක් විය. | අතිරික්ත බඳවා ගැනීම් සීමා කළ යුතුවේ. | බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලද විගස ඉහත ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හැකියාව ලැබෙන අතර ඒ අනුව අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා බඳවාගෙන ඇති තනතුරු ඉවත් වන බව දන්වා සිටිමි. |

**3.4 වත්කම් කළමණාකරණය**

----------------------------

**3.4.1 පවරා නොගත් වත්කම්**

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| ගිණුම්ගත කර තිබුණු වත්කම් 05 ක් හා අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටි අක්කර 06 ක ඉඩම් පවරාගෙන නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සොයා ගැනීමට නොහැකි වූ වාහනවල තොරතුරු වාහන නිෂ්පාදිත ආයතනවලින් ලබාගෙන, ගොනුවක් සකස් කිරීමට හා රක්ෂණය කර නොමැති වාහන රක්ෂණය කිරීමට කටයුතු කරමින් පවතී. |